# 6 මෙසියානික අනාවැකි



6.1 රූපය - ආදම් සහ ඒව

අපේ ආදි මවුපියන් වූයේ ආදම් සහ ඒව ය. ඔවුහු දෙවියන් වහන්සේට අකීකරු වූහ. එම නිසා ඔවුන් ඒදන් උයනෙන් නෙරපනු ලැබිණි. තම වරදෙන් හා තම කැමැත්තෙන් පාපයට වැටුණු මිනිසාට දෙවියන් වහන්සේ ප්‍රේම කළ සේක. අහිමි වූ සදාතන ජීවිතය නැවත උදා කර දෙන පිණිස ගැලවුම්කරුවෙකු එවීමට පොරොන්දු වූ සේක.

## ආබ්‍රහම් තුමාගේ කැඳවීම

ලෝක ගැලවුම්කරුවාණන් වූ ජේසුස් වහන්සේ මෙලොවට එවීම සඳහා ගැලවීමේ ඉතිහාසය සුදානම් කිරීමට දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා කැඳවූ සේක.

සමිඳාණන් වහන්සේ ආබ්‍රම්ට (ආබ්‍රහම්ට) කතා කොට, "නුඹේ මව් බිම ද නුඹේ නෑදෑයන් ද නුඹේ පියාගේ ගෘහය ද අත්හැර දමා, මා පෙන්වන්නට යන දේශයට යන්න. මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි. මම නුඹට ආශිර්වාද කරන්නෙමි; නුඹේ නාමය ... කීර්තියට පමුණුවන්නෙමි. නුඹට ආසිරි පතන අයට මමත් ආසිරි පතමි. නුඹට දෙස් තබන අයට මමත් දෙස් තබමි. නුඹ මගෙන් ආසිරි ලත් අයුරින් මිහි මත සව් සත ආසිරි ලබනු ඇත."

(උත්පත්ති 12:1-3)

මෙම කැඳවීමට පිළිතුරු දුන් ආබ්‍රහම් තුමා, දෙවියන් වහන්සේ කී ලෙස පොරොන්දු දේශය බලා පිටත් විය. මෙය එතුමාගේ දෑඩි විශ්වාසයට සාක්ෂියකි.

ආබ්‍රම්ට වයස අවුරුදු හැත්තෑපහක් වූ කල සමිඳාණන් වහන්සේ ඔහුට වදාළ ලෙසට, ඔහු හාරාන් දේශයෙන් පිටත් විය .... මෙසේ ආබ්‍රම් සිය බිරිඳ වන සාරයි ද තම සොහොයුරාගේ පුත් වන ලොත් ද හාරාන් දේශයෙන් රැස් කර ගත් සියලු සම්පත් හා දැසි දසුන් ද රැගෙන කානාන් දේශය බලා නික්ම ගොස් එහි සැපත් විය. ආබ්‍රම්, ඒ දේශය ඔස්සේ ගමන් කර ෂෙකෙම් නගරයේ ශුද්ධ භූමිය වන මොරේහි ආලෝන අරඹ දක්වා පැමිණියේ ය. එකල ඒ රටේ කානානිවරු සිටියෝ ය.

(උත්පත්ති 12:4-6)

## මෙසියස් වහන්සේ පිළිබඳ දිවැස් වැකි

දෙවියන් වහන්සේ මෙලෙස ආබ්‍රහම් තුමා කැඳවනු ලැබුවේ ලෝක ගැලවුම්කරුවාණන් වූ ජේසුස් වහන්සේ මෙලොවට එවීමට ජාතියක් බිහි කිරීමට ය. එම ජාතිය වූයේ ජුදෙව් ජාතියයි. එම ජාතියේ ශ්‍රේෂ්ඨ රජතුමෙක් වූයේ දාවිත් රජතුමා ය. දාවිත් රජතුමාගෙන් ලෝක ගැලවුම්කරුවාණන් පැමිණෙන බව නාතාන් දිවැසිවරයා දාවිත් රජතුමාට දන්වනු ලැබුවේ පහත වචනවලිනි.

නුඹේ ආයු කාලය සම්පූර්ණ වී නුඹේ පියවරුන් සමග සැතපුණ කල්හි, මම නුඹෙන් පැවත එන නුඹේ ම දරුවෙකු නුඹට පසු රජකමට නංවා ඔහුගේ රාජ්‍යයෙහි ඔහු ස්ථිර කරන්නෙමි... නුඹේ වංශය ද රාජශ්‍රීය ද මා ඉදිරියෙහි සදහට ම ස්ථිර කරනු ලබන්නේ ය. නුඹේ සිංහාසනය සදහට ම පිහිටුවනු ලබන්නේ ය."

(2 සාමුවෙල් 7:12-16)

ක්‍රිස්තුන් වහන්සේ අපගේ රජාණෝ ය. උන්වහන්සේගේ රාජ්‍යය සදහට ම පවතින්නේ ය.

ජේසුස් වහන්සේ කන්‍යාවකගෙන් ඉපදීමට නියමිත බව පහත දිවැස් වැකිය පෙන්වා දෙයි.

සමිඳාණන් වහන්සේ ම නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න, කන්‍යාවක් පිළිසිඳ ගෙන පුත්‍රයෙකු බිහි කරන්නී ය; එම්මානුවෙල් යන නම ඔහුට තබන්නී ය.

(යෙසායා 7:14)

එම කන්‍යාව වූයේ මරියෝත්තමාවන් ය. එතුමියගේ පුත්‍රයාට ලැබෙන නාමය එම්මානුවෙල් ය. එහි අර්ථය "දෙවියන් වහන්සේ අප සමග ය" යන්නයි. ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන නිසා උන්වහන්සේගේ උපත තුළින් දෙවියන් වහන්සේ අප සමග විසීමට පැමිණි සේක.

එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා!
තී ජුදාහි ගෝත්‍රවලින්
ඉතා අල්ප වන්නෙහි ය.
එහෙත්, ඉශ්රායෙල් කෙරෙහි
අධිපතියා වීමට කෙනෙක්
තී කෙරෙන් නැගී එන්නේ ය.
එතුමන්ගේ පෙළපතේ මුල
දුරාතීතයෙන් ද
පැරණි යුගයෙන් ද එන්නකි" .... එතුමාණෝ සාමදානය ගෙන දෙන සේක.

(මීකා 5:2-5)

මෙම බයිබල් පාඨය අනුව ජේසුස් වහන්සේ හෙවත් මෙසියස් වහන්සේ උපත ලබන්නේ බෙත්ලෙහෙමේ ය. උන්වහන්සේ සාමයේ කුමාරයාණෝ ය. නැති වී ගිය දේව සබඳතාව ගොඩනගමින් උන්වහන්සේ අපට සාමය උදා කරන සේක.

දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම පූර්ණත්වයට පත් කිරීම සඳහා කැඳවනු ලැබූවෝ දේව හඬට සවන් දී කීකරු වූහ. අප ද එම දේව සැලැස්මට අනුගත විය යුතු ය. දෙවියන් වහන්සේ අප ද විවිධ තත්ත්වයන් තුළ විවිධ සේවාවන් සඳහා කැඳවන සේක. දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම අප විශ්වාසයෙන් යුතු ව පිළිගත යුතු ය. දේව වචනයෙන් අපට ද දේව සැලැස්ම අනාවරණය වේ. සියල්ලෝ ම දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්මේ හිමිකාරත්වය ලබති.

**ක්‍රියාකාරකම**

1. මෙසියස් වහන්සේ පිළිබඳ ව දිවැසිවරුන් ඉදිරිපත් කළ දිවැස් වැකි තුනක් සඳහන් කරන්න.
2. දේව සැලැස්මට අනුගාමී වීමට ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න.
3. පහත සඳහන් විවිධ සේවා සඳහා ඔබට කැඳවීමක් ලැබුණොත් දේව දරුවෙකු ලෙස ක්‍රියා කරන ආකාරය වෙන වෙන ම දක්වන්න.
   - අ) පන්තියේ නායකත්වයට පත් කිරීම
   - ආ) පාසලේ දිව්‍ය පූජාව සංවිධානය කිරීමට පත් කිරීම
   - ඇ) පාසලේ ක්‍රීඩා නායක ලෙස පත් කිරීම
   - ඈ) මීසමේ ශ්‍රමදානයකට සහභාගි වීමට අවස්ථාව ලැබීම.

**ජීවිතයට බිඳක්**

- දෙවියන් වහන්සේගේ හඬට කීකරු වෙමු.
- පැවරෙන වගකීම් උද්යෝගයෙන් ඉටු කරමු.
- දේව දරුවන් ලෙස ක්‍රියා කරමින් ශුද්ධ වූ සභාව පෝෂණය කරමු.